11

# මඩොල් දූව



අපේ හේන එල්ලේ ගඟ මැද පිහිටි දූපතක් වෙයි. එය ගැමියන් හැඳින්වූයේ "මඩොල් දූව" යන නමිනි. කොග්ගල ඔයෙහි තැනින් තැන පිහිටි දූපත් රාශියෙන් මෙය ගැමියන් අතර ප්‍රකට වූයේ, නපුරු මූකළානක් ද සර්ප විමනක් ද ලෙසිනි. එගොඩත් මෙගොඩත් පිහිටි ගම් තිහ හතළිහක මිනිසුන් අතීතයේ පටන් නයින්, පොළඟුන්, මාපිලුන් ආදි සර්පයන් අල්ලා ඔරුවලින් ගෙන ගොස් දමන්නේ මඩොල් දූවෙහි ය. ගැමියෝ තමන්ගේ වත්තට ඇදෙන නයකු, පොළඟකු අල්ලා මල්ලක දමාගෙන ගොස් මේ දූපත අසල දී මුදා හරිති. ඔවුන් එසේ කරන්නේ විසකුරු සර්පයන් හසු වුණු තැන නො මරන බැවිනි.

මඩොල් දූව යකුන් අරක් ගත් තැනකැ යි විශ්වාස කරන නිසා කිසි ම ගැමියෙක් ඒ දූපතට නො යයි. ගඟෙහි මස් මරන ඔරුකාරයෝ ද රැයෙහි ඒ දූපත අසලට පවා තමන්ගේ ඔරු නො පදවති. පුරාණ රජුන්ගේ කාලයෙහි සොරුන් විසින් තනන ලද ගල් ගුහා කිහිපයක් ද පොකුණක් ද එහි ඇතැයි යනු ගැමියන්ගේ විශ්වාසයකි.

සර්පයකු අල්ලා ගන්නා ගැමියා ඔරුවෙන් යාත්‍රා කොට දූපතට ළං වෙයි. ඔහු ඔරුතල්ල  අසලට ම ගොස් මල්ල පිටින් ම සර්පයා ගොඩට වීසිකොට ආපසු ඔරුව පදියි. ගැමියකු ඇතැම් විටක වීසිකරන මල්ල වැටෙන්නේ ගඟෙහි ය.

ගිනි හට්ටියක් හිසින් ගත් අවතාරයක්, මෑතක සිට මසකට හෝ දෙසතියකට හෝ වරක් මේ දූපතෙහි ඇවිදිනු දැක්ක හැකි ය යි සියලු ම ගැමියන් කියතත් එහි ගිය එකකු ගඟබඩ පිහිටි එක ම ගමකිනුදු සොයා ගත නො හැකි වී ය. මඩොල් දූව ගැන ගැමියන් කී කථා ඇසූ මා තුළ එහි යාමට හටගත් ආශාව මැඩගෙන සිටියේ ඉතා අමාරුවෙනි. කිහිප දවසක් මම ජින්නා සමඟ මේ දූපත අසලට යාත්‍රා කළ නමුත් එහි නො බැස්සෙමි. කරන හැම කාරියකට ම අනුබල දෙන ජින්නා එහි බැසීමට මට අනුබල නුදුන්නේ ඔහු ගැමියන්ගේ කතා තරයේ ඇදහූවකු බැවිනි යි සිතමි.

“ඒ දූපතට අඩිය තියන්න එපා” යි අපගේ අදහස් දැන ගත් පොඩි ගමරාල අපට අවවාද කළේ ය. “ඒක සරුප විමානයක්. ඒකේ හොල්මන් තියෙනවා.”

මම දවසක හවස් වරුවේ ජින්නාට ද හොරෙන් ඔරුව බා පැදගෙන ගොස් මඩොල් දූවට බැස්සෙමි. ඔරුවෙන් බැස අඩිය ගැසූ විගස මගේ දෙකකුල දණ හිස් තෙක් මඩෙහි එරිණ. ඒ මඩ වළෙන් මා ගොඩ වුණේ ඉතා අමාරුවෙනි.

දූපත අසල ගංඉවුර, කඩොල් ගසින් හා කිරළ ගසින් ද කැරන් පඳුරින් ද සෙවණ කරනු ලැබූවකි. ඝන ව වැවුණු කැරන් පඳුරුවල කැරන් කොකු විශාල කළිස්සන් වැන්න. දියෙන් නැගුණු කිරළ මුල්, දූපතට මිනිසුන්

ගොඩ බසිනු වළකන පිණිස සිටුවන ලද යවුල් සේ මා බිය ගැන්වී ය. මම කැරන් පඳුරු බිඳගෙන ඉතා අමාරුවෙන් ලොකු ගල් කුලකට නැඟී බැලුවෙමි. දූපත වටා හෙවුණු වනයක් ඇතත් මැද එක් තැනක් වනයෙන් තොර වී ය. එහි කණාටු පොල් ගස් තුනක් ද වල් අඹ පොකුරුවලින් බර වූ අඹ ගස් දෙකක් ද වී ය. කඳු ගැටයක් බඳු මේ දූපත මුදුනෙහි පොල් ගස් තුනක් පැළ කරන ලද්දේ කවරකු විසින් ද? මෙය මීට අවුරුදු පනහකට හැටකට පෙර මිනිසුන් විසූ දූපතක් විය යුතු ය. මම කැලය මැදින් අමාරුවෙන් ගොස් පොල් ගස් පිහිටි එළිමහන් තැනට ළඟා වීමි. වියළී වැටුණු පොල් ගෙඩි කිහිපයක් ගස් යට වී ය. ඉදී වැටී කුණු වන අඹ ද අඹ ගස් යට හිඟ නොවී ය.

අඹ හා කජු කෑමට රැස් වුණු ගිරවුන් හා වවුලන් ද නඟන හඬ දෙකන් හිරි ගන්වන්නක් වී ය. කැරලකු හැඬූ හඬ, මට ඇසුණේ කැලේ සැඟවී සිට මට සරදම් කරනු පිණිස සිනාසෙන මිනිසකු නඟන හඬක් ලෙසිනි. මා ආපසු යන්ට හැරෙත් ම බොහෝ ඈත සිටි මිනිසකු කාරන හඬ වැනි හඬක් මට ඇසිණ. නැවතී කන් දුන් නමුත් ඒ හඬ යළිත් මට නැසිණ. මම ද දෙතුන් වරක් කාරා කෙළ ගසා “කවුද?” යි ඇසීමි. මිනිත්තු පහක් පමණ කන් දී ගෙන සිටි නමුත් මට අමුතු හඬක් නැසිණ. යම් කිසි සතකුගේ හඬක් විය යුතු ය යි සිතූ මා ආපසු ගමන් කළේ යළිත් දූපතට එන අදහස ඇති ව ය. මා අවුලා ගත් පොල් ගෙඩි දෙක ඔරුවෙහි දමා ඔරුවට නැඟ එගොඩ බලා ඔරුව පැදවූයෙමි.

මා කියූ තොරතුරු ඇසූ ජින්නාගේ කුහුල වැඩි වී ය. සතියකට පසු අපි දෙන්නා ම ගොස් දූපතෙහි එක් පැත්තක් පරීක්ෂා කරමින් ඇවිද්දෙමු. අනික් පැත්තට යා යුත්තේ කැලයක් මැදිනි. කැලය මැදින් වැටුණු අඩි පාරක් නො වූයෙන් අපි ඒ පැත්තට යන්න වෑයම් නො කෙළෙමු. අප පරීක්ෂා කළ පැත්තෙහි ගල් ගුහාවක් ද පොකුණක් ද වී ය. ගල් ගුහාව ගල් වඩුවන් විසින් ගල් ගෙයකට හරවන ලද්දක් බව ප්‍රකට කරන සලකුණු එහි හිඟ නොවී ය. එහි ඇතුළු කාමරය තුන් දෙනෙකුට නිදා ගත හැකි තරම් විශාල වී ය. ගල් තලාව මට්ටම් කරන ලද ගල් ලෑල්ලක් වැන්න. ඇතුළත එළිමහන් තැනක් සේ එළිය කරන තරම් හිරුඑළිය එහි පිවිසෙන්නේ කෙසේ දැයි අපට සිතා ගත හැකි නො වී ය.

## ක්‍රියාකාරකම්

01). ★ මෙම පාඩම ශබ්ද නගා කියවන්න.
★ පාඩමේ සඳහන් සිදුවීම් පිළිබඳ ව කතාබහේ යෙදෙන්න.

02). පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i මඩොල් දූව ගැමියන් අතර ප්‍රසිද්ධ වූයේ කුමක් ලෙස ද?

ii ගැමියන් තුළ දූපත පිළිබඳ ව පැවැති විශ්වාස මොනවා ද?

iii මඩොල් දූවට ගිය ළමයාට දකින්නට, අසන්නට ලැබුණු දේ පැහැදිලි කරන්න.

iv දූපත පරීක්‍ෂා කිරීමේ දී ළමයින්ට කුමක් හමුවී ද?

v එහි තිබූ ගල් ගුහාව කෙබඳු වී ද?

vi මෙම දූපතට යාමට ළමයා පෙලඹුණේ ඇයි?

vii එයට හේතු දක්වන්න.

03). පහත සඳහන් වචනවල අදහස සොයන්න.

i **ප්‍රකට**
ii **කුහුල**
iii **අනුබල**
iv **සලකුණු**
v **ගඟබඩ පිහිටි**

04). පාඩම කියවා මෙම වාක්‍ය කොටස්වලින් කියැවෙන අදහස ලියන්න.

- i හේන එල්ලේ ගඟ මැද පිහිටි
- ii නපුරු මුකළානක්
- iii සර්ප විමානයක්
- iv යකුන් අරක් ගත් තැනක්

**භාෂා භාවිතය**

'01). මේ පාඩම කියවා ඔබේ සිත්ගත් කොටසක් විස්තර කරන්න.

ඊයේ මල්ලිත් මමත් පාසල නිමා වී ගෙදර පැමිණි විගස නා, පිරිසිදු වී, හවස හතර වන තෙක් පාඩම් කළෙමු. එතැන් පටන් ඇඳිරි වැටෙන තුරු ම සෙල්ලම් කළෙමු. "දැන් මහන්සි නොවේ ද" යි කියමින් අම්මා අප කැඳවා රස කැවිලි ද තේ ද දුන්නා ය.

**මෙම කොටසේ ඉරි ඇඳි පද බලන්න. ඒවා නිපාත නමින් හැඳින්වේ. නාම හෝ ක්‍රියා මෙන් වෙනස් රූප නොගන්නා පද නිපාත නම් වේ. නිපාත පද, පදයකට මුලින් හෝ අගින් හෝ පද දෙකක් අතර යෙදේ.**

02.) මේ වාක්‍යවල ඇති නිපාත පද තෝරන්න.

- i නංගී ද මම ද පාසල් යමු.
- ii ගොවියා හේනට ගියේ ය.
- iii කම්කරුවෝ උදේ පටන් සවස් වන තුරු වැඩ කරති.
- iv මම උදෑසන ම අවදිවෙමි.
- v හෙට අපට නිවාඩු ලැබේ.

03). පහත සඳහන් කොටුවේ විවිධ අර්ථ දෙන නිපාත පද තිබේ. ඒවා හඳුනාගන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| සහ | අයියෝ | ඒවි | විනා | නිබඳ | අහා |
| ද | ල | බඳු | මිස | නිති | හා |
| ත් | ලු | සහිත | වස් | නිතර | ඔහෝ |
| අනේ | ම | දැන් | තෙක් | අතරෙහි | සමඟ |
| අද | දක්වා | නො | අහෝ | ව | සේ |
| කිම | මෙන් | ඒදු | දක්වා | ඇයි | සදු |
| වහා | වැනි | ඊයේ | තුරු | ය | යි |

ඉහත වගුවෙන් සුදුසු නිපාත පද යොදා පහත සඳහන් වාක්‍ය සම්පූර්ණ කරන්න.

i මල්ලී පාසල් ගියේ____

ii ගංවතුරෙන් ගෙවල්____ පාරවල්____ යට විය.

ii අම්මා ____ මම ____ ගමනක් යන්නෙමු.

iv ____ එවැනි දුකක් කිසිවකුට නොවේවා!

v ඔහු උණෙන්____ කැස්සෙන් පීඩා විඳියි.

vi ____ රජයේ නිවාඩු දිනයකි.

vii ____ මට උදවු කරන්න.

viii ඔහු ආගන්තුකයෙකු ____ හැසිරෙයි.

ix ඔබ කනගාටුවන්නේ ____ ?

x ඔබ ______ මට කවරෙකු පිහිට වෙයි ද ?

04). පාඩමේ එන මෙබඳු නිපාත පද සොයන්න.

05). එම නිපාත පද යොදා අලුත් වාක්‍ය සාදන්න.

**පැවරුම්**

01). මේ පාඩමේ පළමු ඡේදය කියවන්න. එහි අදහස සාරාංශ කොට (කෙටියෙන්) ලියන්න.